# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1840 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 13/12/2024<br>පැය 0930 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**හැඳල පුරාණ රජමහා විහාරස්ථානයේ දුරුතු මහ වාර්ෂික පෙරහැර හේතුවෙන් මාර්ගයේ ගමනාගමනය සීමා කිරීම - වත්තල පොලිස් වසම.**

වත්තල පොලිස් වසමේ හැඳල පුරාණ රාජමහා විහාරස්ථානයේ 67 වන වරට පවත්වනු ලබන ශ්‍රී සම්බුද්ධ ජයන්ති පෙරහර 2024.12.14 වන දින රාත්‍රී 07.00 සිට 2024.12.15 වන දින අළුයම් කාලය දක්වා වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

හැඳල පුරාණ රජමහා විහාරස්ථානයෙන් ආරම්භ කරනු ලබන පෙරහර හැඳල මාර්ගය ඔස්සේ හැඳල හන්දිය දක්වා ගමන් කර කොළඹ - මීගමුව මාර්ගය හරහා ගොස් පරණ මීගමුව මාර්ගය ඔස්සේ ගමන්කර නැවත කොළඹ මීගමුව ප්‍රධාන මාර්ගයට පිවිස අල්විස් ටවුන්, හැඳල හන්දිය ඔස්සේ නැවත විහාරස්ථානයට පැමිණීමට නියමිතය.

මෙම පෙරහර ගමන් ගන්නා කාලය තුල මීගමුව - කොළඹ ප්‍රධාන මාර්ගයේ රථවාහන තදබදයක් ඇතිවිය හැකි බැවින් එම කාලය තුල පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග-**

කොළඹ දෙස සිට මීගමුව දෙසට ගමන් කරන වාහන

- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය.
- හේකිත්ත හන්දියෙන් වමට හැරී හේකිත්ත මාර්ගය ඔස්සේ ඇලකන්ද සිට මීගමුව දක්වා ගමන් කල හැක.
- හේකිත්ත හන්දියෙන් වමට හැරී ඇලකන්ද මාර්ගයෙන් ගමන් කර පල්ලියවත්ත පාලමෙන් වමට හැරී වෙරළ අබියස මාර්ගයෙන් මීගමුව දෙසට ගමන් කල හැක.

- කොළඹ, මෝදර, මට්ටක්කුලිය හරහා කදිරාන පාලමෙන් ඇලකන්ද මාර්ගය ඔස්සේ මීගමුව දෙසට ගමන් කල හැක.

- ඇවරියවත්ත හන්දියෙන් දකුණට හැරී ඇවරියවත්ත, හුණුපිටිය, කඩවත, එඬේරමුල්ල, කිරිබත්ගොඩ, ගණේමුල්ල, රාගම යන ප්‍රදේශවලට ගමන් කරන වාහන වලට එම මාර්ගයේ ගමන් කල හැක.

- මහබාගේ දක්වා ගමන් ගන්නා රථවාහන කෙරවලපිටිය, ඇලකන්ද මාර්ගය ඔස්සේ කුඩගහපිටිය හන්දියෙන් ගමන් කර නාවික හමුදා ඉන්ධන හල අසලින් ලක්ස්ප්‍රේ ආයතනය අසලන් ප්‍රධාන මාර්ගයට ඇතුළු විය හැක.

මීගමුව දෙස සිට කොළඹ දෙසට ගමන් කරන වාහන

- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය.
- ජාඇල අධිවේගී පිවිසුම හා කෙරවලපිටිය අධිවේගී පිවිසුම ඔස්සේ පිවිස කොළඹට ඇතුල් විය හැක.
- මහබාගේ ලක්ස්ප්‍රේ ආයතනය ඉදිරියෙන් දකුණට හැරී කුඩගහපිටිය හන්දියෙන් කෙරවලපිටිය මාර්ගය ඔස්සේ ගමන් කර කෙරවලපිටිය ප්‍රාදේශිය සභාව අසලින් දකුණට හැරී ඇලකන්ද හන්දියට ගොස් වමට හැරී ඇලකන්ද මාර්ගයෙන් කදිරාන පාලමෙන් මට්ටක්කුලිය හා මෝදර හරහා කොළඹට ගමන් කළ හැක.

- මහබාගේ ලක්ස්ප්‍රේ ආයතනය ඉදිරියෙන් දකුණට හැරී කුඩගහපිටිය හන්දියෙන් කෙරවලපිටිය මාර්ගය ඔස්සේ ගමන් කර කෙරවලපිටිය ප්‍රාදේශිය සභාව අසලින් දකුණට හැරී ඇලකන්ද හන්දියට ගොස් වමට හැරී ඇලකන්ද මාර්ගයෙන් කදිරාන පාලම අසලින් වමට ඇති හේකිත්ත මාර්ගය ඔස්සේ හේකිත්ත හන්දියෙන් දකුණට හැරී කොළඹට ගමන් කළ හැක.

- බංගලාවත්ත හන්දියෙන් දකුණට හැරී බංගලාවත්ත මාර්ගය ඔස්සේ කෙරවලපිටිය මාර්ගයේ ගමන්කර කෙරවලපිටිය හන්දියෙන් දකුණට හැරී ගමන්කර ඇලකන්ද හන්දියෙන් වමට හැරී ඇලකන්ද වංගුව අසලින් වමට හැරී හේකිත්ත මාර්ගයේ ගමන්කර දකුණට හැරී කොළඹ - මීගමුව ප්‍රධාන මාර්ගයට පිවිස කොළඹ දෙසට ගමන් කළ හැකිය.

මාර්ගයේ ගමන් ගන්නා රියදුරන්ට හා මහජනතාවට සිදු වන අපහසුතාවය අවම කර ගැනීම සඳහා මේ සම්බන්ධව ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**